2022 NOV 22
LANKAYOUTH CHAT
LANKAYOUTH Since : 2011



# මගේ අරමුණ රටම දන්න වෘත්තීය රංගන ශිල්පියෙක් වීම

## රුවන් මධුසංක

**නම** - රුවන් මදුසංක නවරත්න
**ගම** - කුලියාපිටිය
**පවුලේ විස්තර** - අම්මයි, මමයි, බිරිදයි, පුතයි
**පාසල** - කුලි/ ශාන්ත ජෝශප් පිරිමි මහ විද්‍යාලය

**ඔබ මොනවද කරන්නේ...**
දෙවන සහය අධ්‍යක්ෂවරයෙක් විදියට සේවය කරන අතරතුර රංගනයෙන් දායක වෙනවා. ඊට අමතරව මගේම කියලා සැලෝන් එකක් කරන් යනවා.

**කලා ක්ෂේත්‍රයට සම්බන්ධවන්නේ කෙසේද?**
මම කලා ක්ෂේත්‍රයට සම්බන්ධ වෙන්නේ, දක්ෂ ඒ වගේමජනප්‍රිය රංගන ශිල්පී අනිල් ජයසිංහ මහතා හරහා. එතුමා තමයි මට කලා ලොවේ මංපෙත් විවර කරලා දීලා මගේ හීනයට යන්න තවදුරටත් පාර පෙන්නලා දෙන්නේ.

**පැමිණි ගමන් මග ගැන කෙටියෙන්.**
මම මුලින්ම විෂුවල් ඉම්පැක්ට් නිෂ්පාදන ආයතනයට සම්බන්ධ වී පසුව හිරු එඩ නාලිකාවේ විකාශය වූ වැහිලිහිනි ටෙලිනාට්‍යහි සහය කලා අධ්‍යක්ෂවරයා ලෙස ගාමිනි එස් බණ්ඩාර මහතා යටතේ ඉගෙන ගමින් සේවය එක්වී එතැන් පටන් කලා අධ්‍යක්‍ෂවරයෙකු ලෙසටත් පසුව දෙවන සහය අධ්‍යක්ෂකවරයෙකු ලෙස මේ වනතෙක් වෘත්තීයෙන් මාගේ දායකත්වය ලබාදෙන අතර රංගනයෙන්ද දායක වෙනවා.

**ආර්ට් ඇසිස්ටන්ට් කෙනෙක් ලෙස ආපු ගමන් මග ගැන කියමුද?**
සහය කලා අධ්‍යක්ෂවරයෙකු යනු කවුද, වගකීම රාජකාරිය මොකක්ද යන්න හා ටෙලිනාට්‍ය කලාව පිලිබදව අවු 12 කට ආසන්න කාලයක් කලා ක්ෂේත්‍රයේ නියලීමට අඩිතාලම ලබාදී අයනු ආයනු කියාදුන්නේ ගාමිනි එස් බන්ඩාර මහතා

**ඒ වගේම ඔබ සහය අධ්‍යක්ෂවරයෙක්. ඒ ගැනත් කියමුද?**
දෙවන සහය අධ්‍යක්ෂකවරයෙකු වීමේ මාගේ ඊළග සිහිනයට අත දුන් සහය අධ්‍යක්ෂකවරුන් වන ප්‍රියන්ත ශ්‍රී සමරකෝන්, ප්‍රදීප් කේ රාජපක්ෂ, හසිත රාජපක්ෂ, ප්‍රනීත් ගුණරත්න, චිරංග තිලකරත්න ඇතුලු නම් සදහන් නොකලද මා හට උදව් උපකාර කල සියලුම මාගේ මිතුරු සහය අධ්‍යක්ෂකවරුන් හට ස්තුතිවන්ත වෙනවා.

**ආර්ට් ඇසිස්ටන්ට් කෙනෙක් සහ සහය අධ්‍යක්ෂවරයෙක් ලෙසින් ලබා ඇති අත්දැකීම් ගැන කතා කළොත්. එම අංශයන්ගෙන් ඔබ සම්බන්ධ වී ඇති නිර්මාණ**
මා සහය කලා අධ්‍යක්ෂකවරයෙක් හා දෙවන සහය අධ්‍යක්ෂක ලෙස වැහිලිහිනි, දුටු නුදුටු මල, හාට් කාට්, පිත්තල කොන්ඩෑරුම, පිච්ච මල සුවදයි, මහින්සා, නීල පබලු ඇතුළු ටෙලිනාට්‍ය කීපයක හා ඉදිරියේදී තිරගත වීමට නියමිත පාස්පෝට් චිත්‍රපටය සදහා මා වෘත්තීයෙන් දායකත්වය ලබාදී තිබෙනවා.

**ඒ වගේම ඔබ මේ වන විට රංගන ශිල්පියෙක්.**
ඔව්... දැනට මම රංගනයෙන් නිර්මාණ කීපයකටම සම්බන්ධ වී රංගනයෙන් දායකත්වය ලබා දෙනවා.

**පෙර කරන ලද ක්ෂේත්‍රයන් දෙකෙන් රංගනයට ලැබෙන්නේ මොන වගේ පිටුවහලක්ද?**
ඇත්තටම මං අවු 12 කට ආසන්න කාලයක් ක්ශේත්‍රයේ වෘත්තීයේ නියලීම මගින් මා ලබාගත් අත්දැකීම් නිසා මා හට රංගනයේ යෙදීමේදි ඇතිවන ගැටලු වන බය චකිතය, සබකෝලය, දෙබස් හැසිරවීම වැනි බොහෝ දේ නිරාකරණය කරගැනීමට බොහෝ උපකාරී වුණා. නමුත් රංගනය කියන බැරෑරුම් කාර්ය පිලිබදව ආධුනිකයෙක් විදියට මම තවමත් මුල සිට ඉගෙන ගනිමින් මගේ ජීවිතයට අත්දැකීම් එක්කරගන්න හැමවෙලේම උත්සාහ කරනවා.

**රංගනයෙන් දායකත්වය දක්වා ඇති දේ කිව්වොත්.**
මා දැනට ෆෙංශුයි ගෙදර, වැහිලිහිනි, හිරු දරුවො, දුටු නුදුටු මල, අපූර්වා, මහිංසා, ඉසිවරුන, කොලඹ ඉතාලිය, කඳකදපඉද, ධවල හස්තියා, අහස් මාලිගා, සොදුරු ආගන්තුයා, හාට් කාට්, කෝපි කඩේ හා මේ දිනවල හිරු එඩ හි විකාශනය වන ලංවී ටෙලිනාට්‍යහි රංගනයෙන් දායකත්වය ලබාදී තිබෙනවා. ඊට අමතරව මිගෙට්ටු වත්තේ ගුණානන්ද හිමි, තානාපතිලාගේ ගෙදර යන චිත්‍රපට දෙකෙහිද රංගනයෙන් දායකත්වය ලබාදී තිබෙනවා.



**ඉදිරියේදී දක්නට ලැබෙන නිර්මාණ මොනවද?**
ඉදිරියේදී විකාශනය වීමට නියමිත නව නිර්මාන දෙකකටද රංගනයෙන් දායකත්වය ලබාදී තිබෙනවා.

**අත්දැකීම් රැසක් ලබාඇති කෙනෙක් වන ඔබ කෙසේද මෙම ක්ෂේත්‍රය දකින්නේ.**
ඇත්තටම නිසි අධ්‍යාපනයක්, හැදෑරීමක් සහ පුහුණුවක් ඇතිව උනන්දුවෙන් කැපකිරීම් කරන්න පුලුවන්නන් ගොඩක් හොද දුර ගමනක් යන්න පුලුවන් මේ ක්ෂේත්‍රයක් !

**මේතාක් දුර පැමිණි ගමනට අතහිත දීපු අය ගැන කතා කළොත්.**
මට මේ ගමන එන්න කලා ක්ෂේත්‍රයේ මංපෙත් විවර කර දුන්නේ ආදරණීය දක්ශ ජනප්‍රිය රංගන ශිල්පී අනිල් ජයසිංහ මහතා. ඒ වගේම ගාමිණි එස් බණ්ඩාර, කපිල කුමාර සමරකෝන්, ප්‍රදීප් කේ රාජපක්ෂ, හසිත රාජපක්ෂ, චිරංග තිලකරත්න, මනනුවන් රූපසිංහ, සුසන්ත රාමසිංහ, ප්‍රනීත් ගුණරත්න, ප්‍රියන්ත ශ්‍රී සමරකෝන්, ලසිත ආර් සමරතුංග, හසිත රංගන ඇතුලු නම් සදහන් නොකල බොහෝ දෙනක් සිටින අතර සරත් දර්මසිරි මහතා, ජෝශප් ජෙරම් මහතා, සමන් කුමාර ලියනගේ යන ආදරනීය අධ්‍යක්‍ෂක මහත්වරුන්ටද නම් සදහන් නොකල අනෙක් අධ්‍යක්ෂක තුමන්ලාටද ස්තුතිවන්ත වෙනවා. ඊට අමතරව තව විශේෂයෙන් මතක් කරන්න ඕනේ හිරු එඩ හි විකාශනය වූ අලු යට ගිනි වැඩසටහනෙන් කෙසෙල්වත්ත දිනුක කියන ප්‍රධාන චරිතය හරහා රටක් දැන හඳුනගන්නා තැනට ජනප්‍රියත්වයක් ලබාදීමට කටයුතු කළ හිරු එඩ ආයතනයේ සේවය කරන සහය නිශ්පාදක, වගේම අධ්‍යක්ෂකවරුන් වන ලසිත ආර් සමරතුංග, මලින්ද යන මහත්වරුන්ටද ගොඩක් ස්තුති වන්ත වෙනවා !

**පවුලේ අයගෙන් ලැබෙන සහයෝගය කෙසේද?**
මගේ අම්මා, බිරිද මට මගේ මේ හීන එකින් එක හැබෑ කරගන්න ඔවුන්ට පුලුවන් උපරිමයෙන්ම.මට සහයෝගය ලබා දෙනවා.

**මොනවද ඉදිරි බලාපොරොත්තු**
ඉදිරි බලාපොරොත්තුව නම් රටම හඳුනන, දක්ෂ වෘත්තීයමය රංගන ශිල්පියෙක් වීම

**ක්ෂේත්‍රයට පිවිසීමට බලාපොරොත්තුවෙන් සිටින අයට දෙන්නේ මොන වගේ උපදෙසක්ද?**
ක්ෂේත්‍රයට පිවිසීමට බලාපොරොත්තුවෙන් සිටින අයට කියන්න තියෙන්නේ, මුලින්ම තමන්ගේ හැසිරීම, විනය, ක්ෂේත්‍රයේ ප්‍රවීනයින්ට ගරු කිරීම වැනි දේවල්වලට අමතරව රංගනය පිළිබඳව යම් හැදෑරීමක් සහිතව ක්ශේත්‍රයට එන්න පුලුවන්නන් ගොඩක් හොද ආරම්භයක් ලබාගෙන ගොඩක් හොද අවසානයක් දක්වා ඉක්මනින්ම තමන්ගේ ගමනාන්තයට යන්න උදව් උපකාර වේවි කියලා මම පුද්ගලිකව විශ්වාස කරනවා.

**අනුර ප්‍රේමකුමාර**

පිටුසැකසුම
Lankayouth.com